SLSI
SYSTEM CERTIFIED
ISO 9001

SLAB
ACCREDITED
ISO/IEC: 17021
QMS-001-01

# උපායමාර්ගික සැලැස්ම
# 2025 - 2029

SPID
Est.1989

## දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව

# විධායක සාරාංශය

දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව දකුණු පළාතේ වාරිමාර්ග සංවර්ධනය හා නඩත්තුව සම්බන්ධව ප්‍රධාන වගකීම දරන්නා වේ. මෙයට ප්‍රධාන හේතුව දකුණු පළාත තුළ පිහිටා ඇති වාරි පද්ධති බොහෝමයක් අන්තර් පළාත් නොවන වාරි පද්ධති වීම වන අතර, 13 වන ව්‍යවස්ථා සංශෝධනය අනුව සහ 2019 අංක 01 දරණ දකුණු පළාත් වාරිමාර්ග ප්‍රඥප්තිය අනුව, අන්තර් පළාත් නොවන වාරි පද්ධතිවල ක්‍රම සම්පාදනය, පාලනය කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම හා නඩත්තුව පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත.

දෙපාර්තමේන්තුව විසින් සේවය ලබා ගන්නා ප්‍රධාන සේවාලාභීන් ලෙස ගොවි ජනතාව සඳහන් කළ හැකි අතර, ඉන් ඔබ්බට සලකා බැලීමේදී සාමාන්‍ය ජනතාව, ව්‍යාපාරික ප්‍රජාව, සංචාරකයින් ආදී ලෙස පුළුල් පරාසයක විහිදුනු සේවාලාභීන් වෙත සේවය සලසන බව හඳුනාගත හැකිය. මෙම ලබා දෙනු ලබන සේවාව, වාරි ජල සම්පාදනය, ගංවතුර පාලනය සහ කරදිය පාලනය ලෙස ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වෙයි.

දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ජල මූලාශ්‍ර ගැන සලකා බැලීමේදී ගාල්ල දිස්ත්‍රික්කයට වැව් 04 ක්, මාතර දිස්ත්‍රික්කයට වැව් 29 සහ හම්බන්තොට දිස්ත්‍රික්කයට වැව් 872ලෙස, වැව් 905 ක ජල පාලනය ඉටු කරනු ලැබේ. මෙමඟින් ගොවි ජනතාව වෙත වගාව සඳහා අවශ්‍ය ජලය සැපයෙන අතර, ජල පාලනය ක්‍රමවත්ව ඉටුකිරීම සඳහා ඒ හා බැඳුනු ඇල මාර්ග පද්ධතිය සහ අමුණු නඩත්තුව නිසි ආකාරව ඉටු කරමින් පවතී.

වාරි ව්‍යාපෘති නඩත්තු කටයුතු සඳහා 2024 වර්ෂයේදී රු. මිලියන 305 ක මුදලක ව්‍යාපෘති ආරම්භ කර ඇති දෙපාර්තමේන්තුව, ඉදිරි පස් වසර තුළදී මිලියන 4670 කට ආසන්න මුදලක් සංවර්ධනය කටයුතු සඳහා යෙදවීමට සැලසුම් සකස් කර ඇත.

මෙම සංවර්ධන වැඩසටහන් මඟින් ජල අවශ්‍යතා සැපිරීම සහ ජලයේ තිරසර කළමනාකරණය සහතික කිරීම යන තිරසර සංවර්ධන ඉලක්කය සපුරා ගැනීම දෙපාර්තමේන්තුවේ ඉලක්කය වී පවතී.

අදාල සේවාලාභීන් වෙත ප්‍රශස්ථ සේවාවක් ලබාදීමත්, දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවය ඉහල නැංවීමත් සඳහා විධිමත් අධ්‍යයනයක් සහ විධිමත් උපාය මාර්ගික සැලසුමක අනිවාර්යය අවශ්‍යතාවය හඳුනාගෙන ඇති දෙපාර්තමේන්තුව 2025-2029 කාල පරාසය සඳහා සකස් කරන ලද උපාය මාර්ගික සැලසුම සඳහා වන ප්‍රවිශ්ඨය මේ තුළින් ලබා ගෙන ඇත. මෙහිදී ප්‍රථමයෙන්ම වාරිමාර්ග සම්බන්ධව වන සියළු පාර්ශවකරුවන් හඳුනාගන්නා ලද අතර, අදාල පාර්ශවකරුවන්ගේ රැස්වීම් පැවැත්වීම මඟින් ඔවුන්ගේ අදහස් හා යෝජනා ලබා ගන්නා ලදි. ඒ අනුව, පාර්ශවකරුවන්ගෙන් ලබා ගත් අදහස් හා යෝජනා මුල්කරගෙන සිදුකරන ලද විද්‍යාත්මක අධ්‍යයනයේදී PESTEL අධ්‍යයනය හා SWOT විශ්ලේෂණය යන න්‍යායාත්මක ක්‍රමවේදයන් භාවිතා කොට ඇති අතර, ඒ තුළින් ඉදිරි පස් වසර සඳහා සැලසුම සකස් කිරීම සිදු කරන ලදි.

එසේ සකස් කරන ලද පස් අවුරුදු සැලැස්ම පරිච්ඡේද 08කින් සමන්විත වන අතර එහිදී, උපාය මාර්ගික දිශානතීන්, ආයතනයේ අභ්‍යන්තර හා බාහිර පරිසර විශ්ලේෂණය, කාර්ය සාධන සමාලෝචනය, ශඳුඅත විශ්ලේෂණය, සැලසුම ක්‍රියාත්මක කිරීමේ විධිවිධාන, ඇගයීම සහ පාලනය පිළිබඳව සාකච්ඡා කරනු ලැබේ. තවද, මෙම සැලසුමේ සාර්ථකත්වය විමසා බැලීම සඳහා අත්‍යාවශ්‍ය පසු විපරම් ක්‍රමවේදය එක් පරිච්ඡේදයක් තුල උපාය මාර්ගික සැලැස්මට ඇතුලත් කර ඇත. එම පසු විපරම් ක්‍රමවේදය ශක්තිමත්ව ක්‍රියාත්මක කිරීම තුලින් සැලැස්ම සාර්ථක කර ගැනීමත් දෙපාර්තමේන්තුව වර්ධනය කිරීමත් අභිප්‍රාය වේ.

# කෙටි යෙදුම්

- GIS – Geographical Information System ( භූගෝලීය දත්ත පද්ධතිය)
- GPS – Geographical Positioning System (භූගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතිය)
- MIS – Management Information System (කළමනාකරණ තොරතුරු පද්ධතිය)

## පරිච්ඡේද අංක 01

# ආයතනික පසුබිම, බලය ලැබී ඇති ආකාරය, අරමුණු, බලය හා ක්‍රියාකාරකම්, දෙපාර්තමේන්තුවේ විකාශනය



## 1.1 ආයතනික පසුබිම

දකුණු පළාත් සභාවේ කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, වාරිමාර්ග, ජල සම්පාදන හා ජලාපවහන, ආහාර සැපයුම් හා බෙදාහැරීම්, වෙළඳ සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය යටතේ අධ්‍යක්ෂවරයෙකුගේ ප්‍රධානත්වයෙන් ස්ථාපිත අනන්‍ය දෙපාර්තමේන්තුවකි. එමෙන්ම, මෙම දෙපාර්තමේන්තුව වෙත වෙන් වූ වැය ශීර්ෂයකින් ප්‍රතිපාදන ලැබේ.

## 1.2 බලය ලැබී ඇති ආකාරය (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව)

ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථා සංශෝධනයේ, 09 වන උප ලේඛනයේ 01 වන ලැයිස්තුවේ 19 වන ව්‍යවස්ථාවෙන් පළාත් සභාවට පැවරී ඇති බලතල අනුව හා 2019 අංක 01 දරණ දකුණු පළාත් වාරිමාර්ග ප්‍රඥප්තිය මඟින් එහි විධි විධාන ක්‍රියාත්මක කිරීම සඳහා බලය දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ඇත.

## 1.3 අරමුණු, බලය හා ක්‍රියාකාරකම්

දකුණු පළාතේ අන්තර් පළාත් වාරිමාර්ග යෝජනා ක්‍රම හෝ අන්තර් පළාත් වාරි සහ ඉඩම් සංවර්ධන ක්‍රම හැර සියළු වාරිමාර්ග වැව් සහ සම්බන්ධ ක්‍රම සම්පාදනය, ඒවා සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා නඩත්තු කිරීම අරමුණු කරගෙන හා 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හා දකුණු පළාත් වාරිමාර්ග ප්‍රඥප්තියේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සඳහා දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව පවතී.

## 1.4 දෙපාර්තමේන්තුවේ විකාශනය

- 1855 - 1860 - මහජන වැඩ දෙපාර්තමේන්තුව පිහිටුවීම. (පැරණි වාරි ක්‍රම ප්‍රතිසංස්කරණය)
- 1856 - 1856 අංක 09 දරණ පළමු වන වාරිමාර්ග ආඥා පනත.
- 1887 - වාරිමාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු පළාත් වාරිමාර්ග මණ්ඩල වෙත පැවරීම.
- 1900 - වාරිමාර්ග දෙපාර්තමේන්තුව පිහිටුවීම.
- 1946 - වාරිමාර්ග ආඥා පනත සංශෝධනය කිරීම.
- 1968 - වාරිමාර්ග ආඥා පනත නැවත සංශෝධනය කිරීම. (කුඹුරු පනත අනුව)
- 1989 - පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව කරාපිටියේදී ස්ථාපිත කිරීම.
- 1992 - 2006 - දෙපාර්තමේන්තුව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය යටතේ ක්‍රියාත්මක වීම.
- 1995 - මාතර හා හම්බන්තොට කාර්යාල ස්ථාපිත කිරීම.
- 2006 - කෘෂිකර්ම, වාරිමාර්ග ... අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වීම.

## 1.5 වාරි ගීතය

**<u>දකුණු පළාත් වාරි ගීතය</u>**




*අහස් ගව්වෙන් ඇදී එන රිදී රේඛාවෝ*

*වැව් අමුණු ඇළ දොළ බුබුළුවල පණ පිහිටවූවෝ*

*ගම් නියම් ගම් දකුණු ලක යල මහේ රන් උපද්දන*

*වාරි සම්පත සුරක්ෂා කරනා.. ඥාන සම්පත් දරාගෙන සිටිනා*



*නීල දිය බිඳු රැලි රැලී... පළඳවා එන හසරැලී*

*මුදා දියවර සිලි සිලී.. ගොවි සිතේ රස සිතිවිලී..*

*එකින් එකට බැඳී එක හුස්මක ඇති සිරිබර කෝමල එල්ලංගා...*



*වැවට ඇලුම් ගෙන වැව් රූ සෝබා.. ධන උල්පතකට යොමු කරනා*

*සොබාව නරඹන දෙස් විදෙස් ඇස් වශීකෘතව නිති පෙම් බඳිනා*

*වාරි සෙවන වැව් තාවුල්ලෙන් පිට තෙරපෙන සිත්වල ගිම් නිවනා*



*දිය කඳ වියරුව ඉල්පෙන තාලෙට දමනය කරනට මඟ පෙන්වා*

*ඉම නොපෙනෙන කෙත් යායට පුදිනා සිතුවිලිවල සැනසුම සදනා*

*සාර සුභාවෙන් දකුණු විජය බිම කෙත් කිරි වද්දන දිය බඳිනා*

*රටටම බත සපයන දකුණේ ගොවි රජ වරුනගෙ සිත් දිරි වඩනා..*



# පරිච්ඡේද අංක 02

## උපාය මාර්ගික දිශානතීන්

Strategic Directions

NAVIGATING YOU TOWARDS YOUR GOALS

**of**

SPID

Est.1989

## 2.1 මෙහෙවර

නවීන තාක්ෂණය, යහපාලනය හා පරිසර හිතකාමී බව පෙරදැරි කර ගනිමින් ප්‍රමිතියෙන් යුතු හා ආකර්ෂණීය පරිසරයක් ඇති වන පරිදි දකුණු පළාතේ වාරි පද්ධති සංවර්ධනය, වාරි ජලය සැපයීම, කරදිය පාලනය, ගංවතුර පාලනය සහ දකුණු පළාතේ ගොවි ජනතාව ප්‍රමුඛ සමස්ථ ප්‍රජාවට උපරිම ප්‍රතිලාභ ලැබෙන පරිදි ජල මූලාශ්‍ර කළමනාකරණය කිරීම.

## 2.2 දැක්ම

2030 දී විශිෂ්ඨතම පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වීම.

## 2.3 අපගේ කාර්ය සාධන දර්ශක (ඇමුණුම් අංක 01)

### 2.3.1 වාරිමාර්ග ඉදිකිරීම්, ඉඩම් හා ජල කළමනාකරණ

| කාර්ය සාධක දර්ශක | පාදක වර්ෂය 2024 | 2025 ඉලක්ක | 2026 ඉලක්ක | 2027 ඉලක්ක | 2028 ඉලක්ක | 2029 ඉලක්ක |
|---|---|---|---|---|---|---|
| ප්‍රතිදානය<br>1.සංවර්ධිත ඇළ මාර්ග දිග(කි.මී) | 575 | 150 | 180 | 210 | 215 | 240 |
| 2. සංවර්ධිත වැව් සංඛ්‍යාව | 60 | 30 | 30 | 30 | 30 | 30 |
| ප්‍රතිඵලය<br>1.වාරි ජලය සපයන ලද ඉඩම් ප්‍රමාණය | 4500 | 4500 | 4950 | 5400 | 6000 | 6600 |
| ප්‍රතිදානය<br>1. අයිතිය තහවුරු කර ගන්න ලද ව්‍යාපෘති ගණන | 7 | 06 | 06 | 06 | 06 | 06 |
| ප්‍රතිදානය<br>1. පිහිටුවන ලද මායිම් ගල් ප්‍රමාණය | 1600 | 600 | 600 | 600 | 600 | 600 |
| ප්‍රතිදානය<br>1.ගංවතුරෙන් ආරක්ෂාව සඳහා සිදු කරන ලද ව්‍යාපෘති ගණන | 20 | 30 | 30 | 30 | 30 | 30 |

### 2.3.2 ජල මූලාශ්‍ර සඳහා පරිසර කළමනාකරණය

| කාර්ය සාධක දර්ශක | පාදක වර්ෂය 2024 | 2025 ඉලක්ක | 2026 ඉලක්ක | 2027 ඉලක්ක | 2028 ඉලක්ක | 2029 ඉලක්ක |
|---|---|---|---|---|---|---|
| <u>ප්‍රතිඵලය</u><br>1.ජලජ පැලෑටි වලින් බේරාගන්නා ලද වපසරිය(හෙක්.) | 200 | 20 | 20 | 20 | 20 | 20 |

### 2.3.3 ආයතන, ප්‍රතිපත්ති හා යහපාලනය

| කාර්ය සාධක දර්ශක | | පාදක වර්ෂය 2024 | 2025 ඉලක්ක | 2026 ඉලක්ක | 2027 ඉලක්ක | 2028 ඉලක්ක | 2029 ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|
| <u>ප්‍රතිදානය</u><br>1.පවත්වන ලද වැඩමුළු සංඛ්‍යාව | | 01 | 01 | 01 | 01 | 01 | 01 |
| <u>ප්‍රතිඵලය</u><br>1.ලබාගත් ඵලදායිතා කුසලතා මට්ටම | ගා | විශේෂ කුසලතා | 3 | 3 | 2 | 2 | 1 |
| | මා | 0 | විශේෂ කුසලතා | 3 | 2 | 2 | 1 |
| | හ | විශේෂ කුසලතා | 3 | 3 | 2 | 2 | 1 |
| | ප | විශේෂ කුසලතා | 3 | 3 | 2 | 2 | 1 |

### 2.3.4 නවීන තාක්ෂණය, නව සේවා හා තිරසර භාවය

| කාර්ය සාධක දර්ශක | පාදක වර්ෂය 2024 | 2025 ඉලක්ක | 2026 ඉලක්ක | 2027 ඉලක්ක | 2028 ඉලක්ක | 2029 ඉලක්ක |
|---|---|---|---|---|---|---|
| <u>ප්‍රතිදානය</u><br>1.ජල මූලාශ්‍ර තොරතුරු සහිතව GIS තාක්ෂණය භාවිතයෙන් සිතියම්ගත කර අවසන් කරන ලද ග්‍රා.නි. වසම් ගණන | 2000 | 2050 | 2100 | 2150 | 2200 | 2200 |

## 2.4 ආයතනික පරමාර්ථ

### 2.4.1ආයතනික පරමාර්ථ

- දකුණු පළාතේ කෘෂිකාර්මික ඉඩම් වල වාරි ජලය සම්පාදනය තහවුරු කිරීම.
- ගංවතුරින් ඉඩම් ආරක්ෂා කිරීම.
- කරදිය ඇතුළුවීමෙන් වන හානිය වළක්වා ඉඩම් ආරක්ෂා කිරීම.
- වාරි රක්ෂිත හා ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය හා ආරක්ෂා කිරීම.
- ජල ධාරක ප්‍රදේශ ජලජ පැළෑටි වලින් බේරාගැනීම.
- ඉදිකිරීම් තත්ත්වයන් වැඩිදියුණු කිරීම.
- ආයතන ධාරිතාවය සංවර්ධනය කිරීම.
- මහජන පිළිගැනීම ඉහළ නැංවීම.

### 2.4.2 තිරසර සංවර්ධන අරමුණු හා සබැඳි ආයතනික පරමාර්ථ

| තිරසර සංවර්ධන අරමුණු | | ආයතනික පරමාර්ථය |
|---|---|---|
|  | 02 - සාගින්න නැති කර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම. | ඇල පද්ධති හා මුලස්ථායි හොඳින් ස්ථාපනය කිරීම. |
|  | 13 - දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම් වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම. | ගංවතුරින් ඉඩම් ආරක්ෂා කර ගැනීම. |
|   | 02 - සාගින්න නැති කර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම.<br><br>06 - සෑමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම. | කරදිය ඇතුළුවීමෙන් ඉඩම් ආරක්ෂා කිරීම. |
|  | 15 - භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියාකිරීම ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්තාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම. | ජලජ පැළෑටි වලින් බේරාගන්නා ලද ජල ධාරක ප්‍රදේශ |

| | | |
|---|---|---|
| | 06 - සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම.<br><br>15 - භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියාකිරීම ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්තාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම.<br><br>16 - තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබා දීම සහ සෑම මට්ටමකම ඵලදායී, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම. | වාරි රක්ෂිත හා ජල පෝෂිත ප්‍රදේශ සංරක්ෂණය හා ආරක්ෂණය කිරීම. |
| | 16 - තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබා දීම සහ සෑම මට්ටමකම ඵලදායී, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම | රක්ෂිත සහ මූලාශ්‍රවල අයිතිය තහවුරු කරගැනීම. |
| | | ඉදිකිරීම් තත්ත්වය වැඩිදියුණු කිරීම. |
| | | ආයතන ධාරිතාවය සංවර්ධනය කිරීම. |
| | | මහජන පිළිගැනීම ඉහළ නැංවීම. |
| | | විනිවිදභාවය වැඩිදියුණු කිරීම. |
| | | නව තාක්ෂණය භාවිතා කිරීම. |
| | | සමාජ ජාල භාවිතය මඟින් වාරි ගැටළු හඳුනා ගැනීම. |
| | | ජල මූලාශ්‍ර කළමනාකරණය කිරීම සඳහා අවකාශමය දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම. |

## 2.5 සංයුක්ත උපාය මාර්ග (Corporate Stratergies)

- රුහුණු සරසවිය සම්බන්ධ කරගනිමින් පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය දැනුම හුවමාරු කර ගැනීම.
- දෙපාර්තමේන්තුවේ සියළු කටයුතු තොරතුරු තාක්ෂණය භාවිතා කර සිදු කිරීම තුළින් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා ගොවි ජනතාව තොරතුරු තාක්ෂණයට යොමු කිරීම.
- වක්වැල්ල කළමනාකරණ සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේ බාහිර (දේශීය/ විදේශීය) පුහුණු වැඩසටහන් වලට නිලධාරීන් යොමු කිරීම මඟින් නිලධාරීන්ගේ දැනුම ඉහල නැංවීම.
- පාසල් මට්ටමේ හෝ පෞද්ගලික අංශයේ නිපැයුම්කරුවන් විසින් වාරිමාර්ග වලට අදාලව කරනු ලබන නව උපකරණ නිෂ්පාදනයන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යොදවා නිෂ්පාදනය මඟින් ඔවුන් දිරි ගැන්වීම.
- නිසි විද්‍යාත්මක ක්‍රමවේදයකට දෙපාර්තමේන්තුවේ වාර්ෂික හා පස් අවුරුදු සංවර්ධන සැලස්ම සකස් කිරීම මඟින් දෙපාර්තමේන්තුවට වෙන් වන ප්‍රතිපාදන ප්‍රමාණය ඉහල නංවා ගැනීම.
- වඩා ඵලදායී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ව්‍යාපෘති අධීක්ෂණය විධිමත් කිරීම, විනිවිද බාවය ඉහල නැංවීම තුලින් දෙපාර්තමේන්තුවේ ප්‍රතිරූපය ඉහල නැංවීම.
- පළාත් සභා හා මධ්‍යම රජයේ ප්‍රතිපාදන වලින් දෙපාර්තමේන්තුවේ සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම.

## 2.6 අගයන්

- **කාල කළමනාකරණය**
  වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා සම්බන්ධ ව්‍යාපෘති වාර්ෂිකව ඉලක්ක ගත අරමුණු සපුරා ගනිමින් නිම කල යුතු අතර, මෙම ව්‍යාපෘති මුළුමනින්ම විවෘත පරිසරයක් තුළ ඉටු කළ යුතුය. එහිදී, වැසි කාලය පිළිබඳව නිශ්චිත වැටහීමක් සහිතව ව්‍යාපෘති අවසන් කිරීම පිළිබඳව සැලසුම් කල යුතුය. එමෙන්ම වාරි ජලය සැපයීම කන්න (යල, මහ) පදනම් කර ගනිමින් සිදු කළ යුතු බැවින් ව්‍යාපෘති සඳහා පවතින නිශ්චිත කාල රාමුවක සැලසුම් හා ක්‍රියාත්මක කිරීම සිදු කල යුතුය. එබැවින්, කාල කළමනාකරණය ඉතා වැදගත් වේ.

- **ආත්ම විශ්වාසය**
  එකිනෙකට වෙනස් ව්‍යාපෘතීන් (විවිධ වූ තත්ත්වයන් යටතේ දේශගුණික, කාලගුණික හා භූගෝලීය පිහිටීම, ගංවතුර වැනි) සිදු කිරීමට වන බැවින්, එම තත්ත්වයන්ට මුහුණ දීමට ආත්ම විශ්වාසය පැවතිය යුතුය. එමෙන්ම මෙම කාර්යයේදී වෙනත් (ආයතන හා ගිණුම්) ක්ෂේත්‍රවල නිලධාරීන්ගේ හා සේවකයන්ගේ ආත්ම විශ්වාසය ඉහත අරමුණ සපුරා ගැනීමේදී පැවතිය යුතුය.

- **කණ්ඩායම් හැඟීම**
  පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ විසින් තනිව සිදු කළ හැක්කක් නොවේ. ඒ සඳහා දෙපාර්තමේන්තුවේ සියළුම, නිලධාරීන් කොටස්කරුවන් විය යුතුය. ඒ අනුව, අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීමට නම් සියළුම දෙනා තුළ කණ්ඩායම් හැඟීම පැවතිය යුතුය.

- **දැනුම් කළමනාකරණය**

  වාරිමාර්ග ඉදිකිරීම් වලදී ව්‍යුහ (Structure) ඉදිකිරීම් සිදුකිරීම අනිවාර්යය වන අතර, ඒවායේ ප්‍රමිතිය මැනවින් පවත්වා ගැනීම සඳහා ඉංජිනේරුවන්ගේ දැනුම පහල ක්ෂේත්‍රවල තාක්ෂණික නිලධාරීන් වෙත කළමනාකරණය වීම අත්‍යාවශ්‍ය වේ.

  අප දෙපාර්තමේන්තුව තුළ පළාත් කාර්යාලය සමඟ දිස්ත්‍රික් කාර්යාල තුනක් පවතී. එහි ගණකාධිකාරීවරිය හා පරිපාලන නිලධාරිනියක් සිටින්නේ පළාත් කාර්යාලයේ පමණි. එහෙත් අපගේම අනෙක් ආයතන වන දිස්ත්‍රික් කාර්යාලවල එවැනි නිලධාරීන් නොමැතිව නිසියාකාරව පවත්වාගෙන යාමට එකී දැනුම එම කාර්යලවලටද කළමනාකරණය විය යුතුය.

- **කාර්යක්ෂමතාවය**

  සීමිත කාලයක් තුළ (වසර තුළ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කල හැකි කාලය සීමා සහිත බැවින්, වැසි කාලය, වගාකරන කාලය හැරුණු විට) ව්‍යාපෘතීන් අවසන් කල යුතු බැවින් හා දෙපාර්තමේන්තුවේ සියළුම සාමාජිකයින් එහි පුරුක් වන බැවින් සියළුම දෙනාගේ කාර්යක්ෂමතාවය පැවතිය යුතුය.

- **විනිවිදභාවය**

  සාමාන්‍යයෙන් වාරිමාර්ග ක්ෂේත්‍රය පිළිබඳව පවතින ආකල්ප වඩාත් ධනාත්මක අයුරින් ඉහල තබා ගැනීමට එහි කටයුතු වඩාත් විනිවිද භාවයකින් සිදුකිරීම වැදගත්ය. එමඟින් සිදුවිය හැකි කිසියම් අක්‍රමිකතාවයන්ද වළක්වා ගනිමින් වඩාත් කාර්යක්ෂම හා සඵල සේවාවක් ලබා දිය හැක.

- **වගවීම හා වගකීම**

  දෙපාර්තමේන්තු ඉලක්ක සපුරා ගැනීම සඳහා සියළුම නිලධාරීන්ට වෙනස් වූ වගකීම් ඉෂ්ඨ කිරීම සඳහා තමා වගවිය යුතුය. එම නිසා වගකීම හා වගවීම යන කරුණු දෙකම පැවතීමෙන් පමණක් දෙපාර්තමේන්තු ඉලක්ක පහසුවෙන් ළඟාකර ගැනීමට හැකි වනු ඇත.

## 2.7 යොමු සළකුණු (Bench Marks)

2.7.1 මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් මිනුම් කටයුතු සඳහා ඩ්‍රෝන තාක්ෂණය භාවිතා කිරීම.

2.4.2 තායිලන්තය වැනි රටවල ගංවතුර අනාවැකි පළකිරීම සඳහා පරිගණකය පාදක කර ගත් අනාවැකි යොදා ගැනීම.

2.4.3 ඇල මාර්ග වල ජල මට්ටම සහ වඩදිය බාදිය මට්ටම් සටහන් කර ගැනීමට ස්වයංක්‍රීය පද්ධති ලෝකයේ බොහෝ රටවල් භාවිතා කරයි.

2.4.4 ජලජ ශාඛ ඉවත් කිරීම සඳහා වීඩ යන්ත්‍රය භාවිතය.

# පරිච්ඡේද අංක 03

# ආයතනික අභ්‍යන්තර හා තත්ත්ව විශ්ලේෂණය



### 3.1.1 සංවිධාන ව්‍යුහය - පවතින



### 3.1.2 සංවිධාන ව්‍යුහය - යෝජිත




ගාල්ල දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය
මාතර දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය
හම්බන්තොට දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය

එක් එක් දිස්ත්‍රික්කයන් තුල එම දිස්ත්‍රික්කයට අදාල සියළු පළාත් වාරිමාර්ග කටයුතු සිදු කිරීම.

## 3.2 මානව සම්පත (Staff)

| | පවතින | යෝජිත |
|---|---|---|
| පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ | 01 | 01 |
| අතිරේක පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ | - | 01 |
| ප්‍රධාන වාරිමාර්ග ඉංජිනේරු | 02 | 01 |
| වාරිමාර්ග ඉංජිනේරු | 03 | 03 |
| ඉංජිනේරු (යාන්ත්‍රික ) | - | 01 |
| දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු | 03 | 03 |
| ගණකාධිකාරී | 01 | 01 |
| මිනුම්දෝරු | - | 01 |
| පරිපාලන නිලධාරී | 01 | 04 |
| සැලසුම් ශිල්පී (විශේෂ පංතිය) | 01 | 01 |
| තාක්ෂණ නිලධාරී (විශේෂ පංතිය) | 04 | 04 |
| සැලසුම් ශිල්පී | 07 | 07 |
| කළමනාකරණ සහකාර | 17 | 17 |
| සංවර්ධන නිලධාරී | 26 | 37 |
| තොරතුරු තාක්ෂණ නිලධාරී | - | 01 |
| භූගෝලීය තොරතුරු තාක්ෂණ නිලධාරී | - | 01 |
| තාක්ෂණ නිලධාරී (සිවිල්) | 44 | 115 |
| තාක්ෂන නිලධාරී (යාන්ත්‍රික) | - | 01 |
| රියදුරු | 08 | 12 |
| යන්ත්‍ර ක්‍රියාකරු | 06 | 11 |
| බෝට්ටු මෙහෙයුම්කරු | 02 | 02 |
| යන්ත්‍ර සහයක | - | 08 |
| කා.කා.ස | 05 | 08 |
| නඩත්තු කම්කරු | 53 | 55 |
| ගබඩා කම්කරු | 03 | 03 |
| | 187 | 299 |

## 3.3 අලෙවිකරණය

අප දෙපාර්තමේන්තුවට අයත් ප්‍රතිලාභීන් ඍජු හා වක්‍ර ලෙස වර්ග කිරීම කළ හැකිය. දෙපාර්තමේන්තුවේ මූලික කාර්යයන් වන වගාවන් සඳහා ජල සම්පාදනය, ගංවතුර පාලනය හා කරදිය වැළැක්වීම යන කාර්යයන් වලදී මහජනතාව වෙත ඍජු හා වක්‍ර යන දෙයාකාරයෙන්ම ප්‍රතිලාභ ලබා දේ. ඊට අමතරව ගොඩනැගිලි සැලසුම් සඳහා නිර්දේශ ලබා දීම, රක්ෂිත සීමා නිර්ණය කිරීම යන කරුණු වලදී මහජනතාව වෙත අපගේ සේවය ලබා දේ.

## 3.3 මූල්‍ය

වාර්ෂික ප්‍රතිපාදන සපයා දීම පළාත් නිශ්චිත, උපමාන පාදක යන මූල්‍ය ප්‍රභවයන් මඟින් සිදු කෙරේ. මීට අමතරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වැනි ආයතන මඟින් ද හඳුනාගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන ලබා දේ. වාර්ෂික මූල්‍ය අවශ්‍යතාවය සම්පූර්ණයෙන් නොලැබී යාමේ තත්ත්වයක් තුළ වඩා ඵලදායී අයුරින් ප්‍රමුඛතාවය පදනම් කරගෙන අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලැබේ.

## 3.4 තාක්ෂණික මෙහෙයුම් නිෂ්පාදනය

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා නවීන තාක්ෂණය භාවිතය ඉහළ මට්ටමක පවතී. වාරි පද්ධති සම්බන්ධ තොරතුරු භූගෝලීය දත්ත පද්ධතියකට ඇතුළත් කිරීම නිසා ඇල මාර්ග වල තොරතුරු ලබා ගැනීම, රක්ෂිත හඳුනාගැනීම ආදී කටයුතු පහසු වී ඇත. මීට අමතරව මිනුම් කටයුතු සඳහා Total Station භාවිතය හේතුවෙන් කඩිනමින් සහ නිවැරදි මිනුම් ගැනීමේ හැකියාව දෙපාර්තමේන්තුව සතුව පවතී.

මීට අමතරව කාර්යාල කටයුතු සඳහා MIS පද්ධතිය විශාල මෙහෙයක් සිදුකරනු ලැබේ. E-Stores, E-Personal, E-Record room ආදී යෙදවුම් අන්තර්ගත කිරීම නිසා කාර්යක්ෂමව කටයුතු කිරීමේ හැකියාව ලබා කරගෙන ඇත.

## 3.5 වෙනත් වත්කම් (Other Assets)

ස්ථාවර වත්කම් - පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය

මාතර දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය

හම්බන්තොට දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය

වාරිමාර්ග ව්‍යාපාර- 09

භූගෝලීය තොරතුරු තාක්ෂණ පද්ධතිය

තත්ත්ව පර්යේෂණාගාරය

| අයිතමය | ප්‍රමාණය |
|---|---|
| කැබ් රථ | 08 |
| කාර් රථ | 01 |
| පෙජරෝ රථ | 01 |
| බැකෝ ලෝඩර් | 01 |
| එක්ස්කැවේටර් | 05 |
| ටිපර් (1Cube) | 01 |
| ට්‍රේලර්ය සමඟ ට්‍රැක්ටර් | 02 |
| වීඩ් හාර්වස්ටර් | 01 |
| වායුසමීකරණ යන්ත්‍ර | 15 |
| පුටු | 328 |
| කබර්ඩ් | 43 |
| මේස | 177 |
| කැමරා | 10 |
| ප්ලොටර් යන්ත්‍ර | 01 |
| පරිගණක | 175 |
| ෆැක්ස් යන්ත්‍ර | 05 |
| ඇඟිලි සලකුණු යන්ත්‍ර | 04 |
| ඡායා පිටපත් යන්ත්‍ර | 09 |
| මුද්‍රණ යන්ත්‍ර | 16 |
| ප්‍රොජෙක්ටර් | 05 |
| ස්කැනර් | 05 |
| රූපවාහිනි යන්ත්‍ර | 05 |
| ස'වර් පරිගණක යන්ත්‍රය | 01 |

# පරිච්ඡේද අංක 04

## බාහිර පරිසර විශ්ලේෂණය



## 4.1 දේශපාලනික - Political

මධ්‍යම රජයේ බලය බවතින දේශපාලන පක්ෂයන් පළාත් සභාවල බලය පවත්නා දේශපාලන පක්ෂයන් හා මධ්‍යම රජයේ පළාත් සභා සම්බන්ධව පවත්නා ප්‍රතිපත්ති යන කරුණු මත පළාත් සභා වලට ප්‍රමාණවත් තරම් ප්‍රතිපාදන වෙන් නොවේ. එමෙන්ම, වාරිමාර්ග ජල මූලාශ්‍ර ආරක්ෂා කර ගැනීම හා රක්ෂිත සම්බන්ධව කටයුතු කිරීමේදීත්, යම් විද්‍යාත්මක ක්‍රමවේදයකට අවුරුද්දේ ව්‍යාපෘති ප්‍රමුඛතා ගත කිරීමේදීත්, එසේ ප්‍රමුඛතා ගත කරන ලද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදීත්, සෘණාත්මක දේශපාලන බලපෑම් ඇති වේ.

කෙසේ නමුත්, යම් අවස්ථා වලදී ඇතැම් දේශපාලනඥයින්ගේ විශේෂ මැදිහත්වීමෙන් පළාත් සභාවේ වාරිමාර්ග වෙත ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණය වැඩි කර ගැනීමටත්, මධ්‍යම රජයෙන් සෘජුවම යම් යම් ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ලබා ගැනීමටත් හැකි වනු ඇත. එසේම සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවන සාමාජීය ගැටළු නිරාකරණය කිරීම සඳහා (පෞද්ගලික විරෝධතා ආදිය) දේශපාලන අධිකාරියේ සහාය හිමි වේ.

## 4.2 ආර්ථික - Economics

කර්මාන්ත ඉටුකිරීමේ දී අත්‍යාවශ්‍ය වේලාවට ප්‍රතිපාදන නොලැබීම, පවත්නා ශ්‍රම හිඟය, ඉදිකිරීම් ද්‍රව්‍ය වල හිඟය (වැලි හා පස්) රජයේ පවත්නා ආර්ථික ප්‍රතිපත්ති (කොන්ත්‍රාත්කරුවන් දිරි ගැන්වීම සඳහා සහන ලබා දීම වැනි වැඩපිළිවෙලක් නොමැති වීම) යන කරුණු මත ව්‍යාපෘති සඳහා වැඩි පිරිවැයක් දැරීමට සිදු වී ඇත.

එමෙන්ම, අනෙකුත් ව්‍යාපාති වලට සාපේක්ෂව සමහර වාරිමාර්ග ව්‍යාපෘති නඩත්තුව සඳහා ද, (පොම්පාගාර වැනි ව්‍යාපෘති) වැඩි පිරිවැයක් යෙදවීමට සිදුවුවත්, සෘජු ප්‍රතිලාභයක් දෙපාර්තමේන්තුවට නොලැබෙන බැවින්, වාරිමාර්ග ව්‍යාපෘති සඳහා අඩු සැලකිල්ලක් පවත්නා රජයන් දැක්වීම.

එසේම, සෘජු ශ්‍රමයෙන් කර්මාන්ත ඉටු කිරීම තුළින් ප්‍රතිපාදන ඉතුරු කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත. ටෙන්ඩර්පත් ප්‍රධානයේ දී අවම මිළ පමණක් නොව ගුණාත්මකබාවය පිළිබඳව ද අවධානය යොමු කිරීමත් කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය යොදා ගැනීමේ දී මිළ අධික අමුද්‍රව්‍ය වෙනුවට වෙනත් විකල්ප යොදා ගැනීම මගින් ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීමට හැකියාව ලැබෙයි.
උදා : අමුණු දොරවල් සඳහා ලැලි වෙනුවට (Steel) විකල්ප යොදා ගැනීම.

එමෙන්ම, කර්මාන්තයක් ඉටුකල පසු ඒවා නියමිත කාලවලදී නඩත්තු කටයුතු කිරීමෙන් අධික මුදලක් වැය වීම වළක්වා ගැනීමට හැකියාව ඇත.

## 4.3 සාමාජීය - Social

නූතන තරුණ ප්‍රජාවගේ සහ සමාජයේ කෘෂිකර්මාන්තය කෙරෙහි පවතින සෘණාත්මක ආකල්පය හේතුවෙන් ජනතාව කෘෂිකර්මාන්තයෙන් විශාල ලෙස ඉවත් වෙමින් පවතී. එමෙන්ම, අතීතයේ ජනතාව කෘෂිකර්මාන්තය ඉතා භක්තියෙන් සිදු කලත්, මේ වන විට එසේ නොමැත. එබැවින්, ජල මාර්ගවලට අපද්‍රව්‍ය මුදා හැරීම, වාරිමාර්ග නිර්මිත වලට හානි සිදුකිරීම, වාරිමාර්ග නඩත්තුවේදී ප්‍රජා දායකත්වය අඩුවීම, ප්‍රතිලාභීන්ට නිසි දැනුවත්බාවයක් නොලැබීම, ව්‍යාපෘති නිසි කාලයන් තුළ ක්‍රියාත්මක නොකිරීම වැනි දෑ සමාජය තුළ හඳුනාගත හැකිය. එමෙන්ම, කෘෂි කර්මාන්තය සඳහා අවශ්‍ය සියළු වාරිමාර්ග කටයුතු රජය විධිමත්ව සිදු කල යුතුය යන සෘණාත්මක ආකල්පය ද ප්‍රතිලාභියා තුළ පවතී.

## 4.4 තාක්ෂණික - Technological

ලෝකයේ අනෙකුත් රටවලට සාපේක්ෂව රාජ්‍ය සේවයත්, කෘෂි කර්මාන්තයේ නියැලෙන ගොවි ජනතාවත්, නව තාක්ෂණය සම්බන්ධව පවතින බිය හා තාක්ෂණික මෙවලම් වල පවතින මිල අධික බව වැනි කරුණු හේතුවෙන් කෘෂි කර්මාන්තය හා වාරිමාර්ග කටයුතු සඳහා නවීන තාක්ෂණය භාවිතය අඩු වී ඇත. එමෙන්ම, යල්පැන ගිය යන්ත්‍ර සූත්‍ර භාවිතය, ගැලපෙන නවීන යන්ත්‍රවල හිඟතාවය, තාක්ෂණය සඳහා මූල්‍ය පහසුකම් නොලැබීම, පර්යේෂණ මගින් ලබා ගන්නා දත්ත නිසි ලෙස යොදා නොගැනීම ආදිය ද හඳුනාගත හැකි ය. තවද, කාලගුණික තත්ත්වයන් පිළිබඳ නිවැරදි පුරෝකථනයක් සිදු කල හැකි මට්ටමේ තාක්ෂණයක් නොමැති වීම හේතුවෙන් ජල කළමනාකරණයද අපහසු වී ඇත.

## 4.5 පාරිසරික - Environmental

මිනිසුන් විසින් අත්තනෝමතික ලෙස සිදු කරන වන විනාශයත්, නිසි තාක්ෂණික ක්‍රමවේද නොමැතිව කඳු ආශ්‍රිත කැලෑ හෙළි කරමින් සිදුකරන වගා කටයුතු සිදු කිරීමත්, විෂමාකාර කාලගුණික හා දේශගුණික වෙනස් වීමත්, හේතුවෙන් අනපේක්ෂිත පාරිසරික විපත් (නායයෑම්, සුනාමි, ගංවතුර..) හේතුවෙන් වාරිමාර්ග වලට විශාල ලෙස හානි සිදු වනු ඇත. තවද, ඉහත සඳහන් කරන ලද හේතූන් නිසා වන පාංශු ඛාදනයන් සෘජුවම ගංගා, ඇල මාර්ග හා වැව්වල තැන්පත් වනු ඇත.

එමෙන්ම, වාරිමාර්ග රක්ෂිත අනවසරයෙන් ගොඩකිරීම, අනවසර වැලි ගොඩ දැමීම, රක්ෂිත සීමාවලට ඔප්පු ලබා දීම මගින් රක්ෂිත අහිමි වීම, වාරි පද්ධතිවලට අපද්‍රව්‍ය බැහැර කිරීම ආදිය ද බහුලව දැකිය හැකි තත්වයන් ය.

ඇළ මාර්ග, වැව් හා ගංගා ආශ්‍රිත රක්ෂිත සීමා නිර්ණය කිරීම මගින් වාරිමාර්ග රක්ෂිත සම්බන්ධව ඇති ගැටළුකාරී තත්වයන් බොහෝමයක් නිරාකරණය කිරීමට හැකියාව ඇත. එසේම වාරි පද්ධති තුළ විසිතුරු මසුන් හා මිරිදිය මත්ස්‍ය වගාව සිදු කිරිම, වාර්මාර්ග රක්ෂිතවල රුක්රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (කුඹුක්, මී), කෘමිනාශක භාවිතය නිර්දේශිත ප්‍රමාණයට සිදු කිරීම, වාරි රක්ෂිත ඇළ මාර්ගවල ඉදිකිරිම් සිදු කිරීමේ දී විවිධ ආයතන සමග ඒකාබද්ධව කටයුතු කිරීම, ගොවිබිම් වනාත හා එළිපෙහෙළි කිරීම තුළින් කෘමි උවදුරු හා ලෙඩ රෝගවලින් වැළැක්වීම, ඇළ මාර්ග ශුද්ධ කිරීම තුළ ක්‍රමවත් වැඩපිළිලෙක් ක්‍රියාත්මක කිරීමෙන් ගංවතුර පාලනය, සතුන්ගෙන් වාරිමාර්ගවලට වන හානිය වළක්වා ගැනීම, ආක්‍රමණික ශාක ඉවත් කිරීම,හා අලංකාරව වාරි පද්ධති ඉදි කිරීම තුළින් සංචාරක ආකර්ෂණය වැඩි වීම තුළ රටට අදායම උපායා ගත හැකි වීම ආදිය යහපත් පාරිසරික ප්‍රවණතා ලෙස හඳුනා ගත හැකිය.

## 4.6 නීතිමය - Legal

එකම ක්ෂේත්‍රයකට වගකියන එක් ආයතනයක් පමණක් වන ලෙස පනත් හා ප්‍රඥප්ති කාලීනව සංශෝධනය නොවීම හේතුවෙන් එම ප්‍රඥප්ති හෝ පනත් වල පවත්නා නීතිය ක්‍රියාත්මක කිරීමේදී දුර්වලතා සිදු වීම. තවද, ප්‍රඥප්ති හෝ පනත් වල පවතින නීතිය දැනට සමාජය සඳහා ප්‍රායෝගිකව යොදා ගත නොහැකි වීම නිසා වාරිමාර්ග කටයුතු සම්බන්ධව නීත්‍යානුකූලව කටයුතු කිරීමේ දී යම් කිසි ප්‍රමාදයක් සිදු වේ. එසේම දෙපාර්තමේන්තුව සඳහා නීති නිලධාරියෙකු නොමැති වීම, වාරිමාර්ග හා කෘෂිකර්මයට ඒකාබද්ධ ජාතික

ප්‍රතිපත්තියක් නොමැති වීම, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ට මතුවන පරිපාලනමය ගැටළු (බලාතික්‍රමණය, අභිමතය වැනි), එකම කරුණට අදාළව ආයතන දෙකක හෝ තුනක පනත් මගින් දක්වා තිබීමෙන් ආයතන අතර ගැටළු දෝලනය වීම, නීතියේ පවතින හිඩැස් (නීතිය සමාන නොවීම, දේශපාලන හා මුදල්මය බලපෑම්), නීතිය ක්‍රියාත්මක කරන ආයතනවල සහයෝගය නොමැති වීම, දෙපාර්තමේන්තුව නොදැනුවත්ව අනෙකුත් ආයතන මගින් අවසර ලබා දීම ආදිය බහුලව දැකිය හැකි තත්වයන් ය.

එසේ වුවද, වාරිමාර්ග සම්බන්ධව නීතිමය කටයුතු කිරීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, ගොවිජන සේවා පනත, වාරිමාර්ග ආඥා පනත, ඉඩම් පනත යන ඒවායේ වාරිමාර්ග වලට අදාල අන්තර්ගතයන් අදාල කර ගනී. තවද, මේ වන විට දකුණු පළාත් සභාව සඳහා වාරිමාර්ග ප්‍රඥප්තියක් අනුමත කර ගෙන ඇති බැවින් වාරිමාර්ග සම්බන්ධව නීතිමය කටයුතු කිරීමේදී එම ප්‍රඥප්තිය යොදා ගැනීම සිදු කරයි..

# පරිච්ඡේද අංක 05




## පසුගිය වසර 03 ක කාර්ය සාධන සමාලෝචනය

## 5.1 දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් පසුගිය වර්ෂ තුන තුළ ක්‍රියාත්මක කරන ලද වාරිමාර්ග ව්‍යාපෘති.

| වර්ෂය | ප්‍රතිසංස්කරණය කරන ලද වාරිමාර්ග ව්‍යාපෘති | | | | | වියදම් කළ මුදල | ඇස්තමේන්තුගත මුදල රු.මි. |
|---|---|---|---|---|---|---|---|
| | ඇල මාර්ග | | අමුණු | වැව් | කෘෂි මාර්ග | | |
| | සංඛ්‍යාව | දිග කි.මී. | | | | | |
| 2022 | 73 | 62.206 | 42 | 33 | 3 | 504.644 | 1061.397 |
| 2023 | 62 | 88.01 | 55 | 6 | - | 185.124 | 220.110 |
| 2024 | 66 | 73.236 | 49 | 13 | 1 | 184.62 | 293.1204 |
| එකතුව | **201** | **223.452** | **146** | **52** | **4** | **874.388** | **1574.627** |






රත්ගම හබරු ඇළ ප්‍රතිසංස්කරණය කිරීම
ගාල්ල දිස්ත්‍රික්කය



පිලාන අන්නාසිවතුගොඩ අමුණ ඉදි කිරීම
ගාල්ල දිස්ත්‍රික්කය



කොටවිල බටහිර උඩුමුල්ල ඇළ මාර්ගය ප්‍රතිසංස්කරණය

මාතර දිස්ත්‍රික්කය



දෙනිපිටිය නැගෙනහිර කේනමන් ඇළ මාර්ගය ප්‍රතිසංස්කරණය

මාතර දිස්ත්‍රික්කය






නෙළුව මාවනාන අමුණ ප්‍රතිසංස්කරණය කිරීම
ගාල්ල දිස්ත්‍රික්කය

අඹේකුඹුර අමුණ ප්‍රතිසංස්කරණය කිරීම
මාතර දිස්ත්‍රික්කය





දොරපේ අමුණ ප්‍රතිසංස්කරණය කිරීම

ගාල්ල දිස්ත්‍රික්කය

බිබුල්ආර ඇළ මාර්ගයේ එරඬුකැටියවල අමුණ ප්‍රතිසංස්කරණය කිරීම

හම්බන්තොට දිස්ත්‍රික්කය








කොටකුඹුක වැව ප්‍රතිසංස්කරණය කිරීම
හම්බන්තොට දිස්ත්‍රික්කය



ඉදිකොලේ වැව ප්‍රතිසංස්කරණය කිරීම
හම්බන්තොට දිස්ත්‍රික්කය



ඉලුක්පැලැස්ස වැව ප්‍රතිසංස්කරණය කිරීම
හම්බන්තොට දිස්ත්‍රික්කය



දීගොඩ වැව ප්‍රතිසංස්කරණය

ගාල්ල දිස්ත්‍රික්කය






**හොරහිටිගොඩ අමුණේ සිට මහකුඹුර අද්දර දක්වා කෘෂි මාර්ගය සංවර්ධනය**

**මාතර දිස්ත්‍රික්කය**





**කහඳ කෘෂි මාර්ගය සංවර්ධනය**

**ගාල්ල දිස්ත්‍රික්කය**





## 5.2 මූල්‍ය ප්‍රගතිය

| | 2022 | | 2023 | | 2024 | |
|---|---|---|---|---|---|---|
| | ලැබීම් රු.මි. | වියදම රු.මි. | ලැබීම් රු.මි. | වියදම රු.මි. | ලැබීම් රු.මි. | වියදම රු.මි. |
| පළාත් නිශ්චිත | 67.84 | 60.537 | 81.719 | 79.342 | 150.00 | 63.06 |
| උපමාන පාදක | - | - | - | - | 40.00 | 30.39 |
| නඩත්තු | 100 | 99.986 | 106.18 | 105.781 | 115.00 | 78.62 |
| වෙනත් | 6.757 | 5.227 | - | - | - | - |
| **එකතුව** | **174.597** | **165.75** | **187.899** | **185.123** | **305** | **172.07** |



පැවති ආර්ථික අර්බුධය හේතුවෙන් 2022 හා 2023 වසර වල අප දෙපාර්තමේන්තුවට ලැබුණු ප්‍රතිපාදන ප්‍රමාණය අඩු වී ඇත. එහි දී එම වසර දෙකෙහිම උපමාන පාදක ප්‍රතිපාදන ලෙස කිසිදු ප්‍රතිපාදනයක් අප දෙපාර්තමේන්තුවට ලැබි නැත. තව ද, 2023 වසර හා 2024 වසරවල අනෙකුත් දෙපාර්තමේන්තු හෝ කාර්යාල හරහා ද අප දෙපාර්තමේන්තුවට කිසිදු ප්‍රතිපාදනයක් ලැබී නොමැත.

ප්‍රතිපාදන වියදම් කිරීම සැලකීමේ දී 2022 වසර හැරුණු කොට අනෙකුත් වසරවල අප දෙපාර්තමේන්තුවට ලැබෙන ප්‍රතිපාදනවලින් 97% ට වැඩි ප්‍රමාණයක් වියදම් කර ඇත. එය 2023 වසරේ වියදම සැලකීමේ දී ද පැහැදිලි වේ. නමුත් 2022 වසරේ පළාත් නිශ්චිත ප්‍රතිපාදන රුපියල් මිලියන 67.84 ක මුදලක් ලැබුණු එම වසරේ පළාත් නිශ්චිත ප්‍රතිපාදන වියදම රුපියල් මිලියන 60.537 පමණ වේ. දෙපාර්තමේන්තුවට ලබා කර ඇති පළාත් නිශ්චිත ප්‍රතිපාදන වල ප්‍රගතිය 89.2% පමණ වේ. පෙර වසරේ පළාත් නිශ්චිත ප්‍රතිපාදන වියදම් කිරීමට ප්‍රථම මූල්‍ය තහවුරුවක් ලබා ගැනීමේ කොන්දේසියක් ඇතුළත් කර තැබීම මෙම මූල්‍ය ප්‍රගතියේ පසුබෑමට හේතු විය.

අනෙකුත් වසරවල අප දෙපාර්තමේන්තුව 97% කට වැඩි මූල්‍ය ප්‍රගතියක් ලබා ගැනීමත් පස් අවුරුදු සැලැසුමට අනුව දෙපාර්තමේන්තුව වාර්ෂික සංවර්ධන සැලැස්ම සඳහා රුපියල් මිලියන 1000 කට වැඩි මූල්‍ය අවශ්‍යතාවයක් පැවතීමත් සැලකීමේ දී දෙපාර්තමේන්තුවට ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණය වැඩිවිය යුතු ය.

### 5.3 අපගේ ගමනේ සංදිස්ථාන (Mile Stones)

i. GIS Database - වාරිමාර්ග සහ ජල මූලාශ්‍ර වල තොරතුරු ඇතුළත් මාර්ග ගත (Online) භූගෝලීය දත්ත පද්ධතිය ස්ථාපිත කිරීම.
ii. Quality Control Lab - ප්‍රමිති පරීක්ෂණය සඳහා තත්ත්ව පරීක්ෂණාගාරයක් ස්ථාපිත කිරීම.
iii. MIS - කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීම. (E-Stores, E-Post, E-Personal, E-Record room)
iv. 2018 ඵලදායිතා සම්මාන තරඟාවලියේ අන්තර් දෙපාර්තමේන්තු අතර තෙවන ස්ථානය ලබා ගැනීම.
v. ISO (9001- 2015 ) තත්ත්ව සහතිකය ලබා ගැනීම.
vi. 2019 අංක 01 දරණ වාරිමාර්ග ප්‍රඥප්තිය දකුණු පළාත් සභාව තුළ සම්මත කර ගැනීම.
vii. තවත් ලබා කර ගත් දෑ බොහෝ ඇත.
උදා:- Auto mated Anicut Gate, දියවර සභරාව, ජලයේ ගුණාත්මක බාවය පරීක්ෂාව...

# පරිච්ඡේද අංක 06

## ශක්‍යතා විශ්ලේෂණය (SWOT)



## 6.1 ශදුඅත විශ්ලේෂණය (SWOT)

## 6.2 ශක්තීන් - Strength

i. නවීන තාක්ෂණික දැනුමෙන් සන්නද්ධ දියුණු මානව සම්පත.

ii. නවීන තාක්ෂණික උපකරණ සහ නවීන තාක්ෂණය භාවිතය.

iii. නිර්මාණශීලීව හා කාර්යක්ෂමව ව්‍යාපෘති ඉටුකිරීමට හැකි වීම.

iv. වියදම් අඩුවීම හා ගුණාත්මකබව වැඩිවීම.

v. වාරිමාර්ග සම්බන්ධයෙන් පවතින ප්‍රෞඩ ඉතිහාසය නිසා දැනටමත් හොඳින් ස්ථාපනය වූ වාරිමාර්ග පද්ධතියක් පැවතීමත්, මහජනතාවගේ උනන්දුවක් පැවතීම.

vi. අප දෙපාර්තමේන්තුව හා සම්බන්ධ පාර්ශවකරුවන්ට කාර්යක්ෂම සේවාවක් සැපයීම හා වාරිමාර්ග පද්ධතිය ආරක්ෂා කර ගැනීමට හැකි වන පරිදි ප්‍රධාන කාර්යාලයකින් හා මනා ලෙස ස්ථාපනය වූ දිස්ත්‍රික් කාර්යාලවලින් සමන්විත මනා සංවිධාන ව්‍යුහයක් පැවතීම.

vii. දෙපාර්තමේන්තුවේ කාර්යයන් වඩා විධිමත්ව හා නෛතික බාවයෙන් යුතුව ඉටුකිරීම සඳහා හැකිවන පරිදි වාරිමාර්ග ප්‍රඥප්තිය මඟින් බලය ලබා දී තිබීම.

viii. සක්‍රියව දායක වන ගොවි සමිති.

ix. නිශ්චිත පළාත් ප්‍රතිපාදන ලැබීම.

x. මනා ජල කළමණාකරණ පද්ධතිය.

xi. රසායනාගාර පහසුකම්.

xii. ගොඩනැගිලි හා භෞතික පිහිටීම.

## 6.3 දූර්වලතා - Weaknesses

i. නීතිමය කටයුතු සඳහා ක්‍රියාමාර්ග ගැනීමට පවතින යාන්ත්‍රණය ප්‍රමාණවත් නොවීම නිසා වාරිමාර්ග රක්ෂිතයන්හි අනවසර ක්‍රියාකාරකම් වලට එරෙහිව නීතිය ක්‍රියාත්මක වීම ප්‍රමාද වීම.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රක්ෂිත ප්‍රදේශ පිළිබඳ ගැටළු බහුල බැවින් නීති නිලධාරියෙකුගේ අවශ්‍යතාවය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව ඉදිරියේ සාධාරණීකරනය කර කඩිනමින් නීති නිලධාරීයෙකු ලබා ගැනීම. දැනට අප විසින් නීති උපදෙස් ලබා ගන්නේ ප්‍රධාන ලේකම් කාර්යාලයට අනුයුක්තව ඇති නීති නිලධාරී මඟිනි. ම නිලධාරියාට දකුණු පළාත තුළ සියළුම ආයතන වල නීති ගැටළු විසඳීමට සිදුවී ඇති බැවින් ඔහුගෙන් උපදෙස් ලබා ගැනීම ප්‍රමාද වේ.

ii. දෙපාර්තමේන්තුව සතු වාරිමාර්ග පද්ධතියේ සංවර්ධනය, නඩත්තු කිරීමේ කටයුතු හා සැසඳිමේදී වාහන, යන්ත්‍ර හා කාර්යය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම.

අනුමත කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු ඇති වූ අවස්ථාවේදී ක්ෂණිකව සම්පූර්ණ කර ගැනීමට පළාත් සභාවේ අදාල බලධාරීන්ට බල කිරීම හා තවදුරටත් ප්‍රමාද වේ නම් නිසි ක්‍රමවේදයක් සකස් කිරීමට (පුරප්පාඩු සම්පූර්ණ කිරීමට පූර්ව සැලැස්මක් සහිතව ක්‍රියාත්මක කිරීම) ඉහළ නිලධාරීන් දැනුවත් කිරීම.

වාහන මිලදී ගැනීම ප්‍රධාන ලේකම් විසින් සිදු කල යුතු අතර, එතෙක් වාහන කුලී පදනම මත ලබා ගැනීම. යන්ත්‍ර මිලදී ගැනීම දෙපාර්මේන්තුව වෙත ලැබෙන ප්‍රතිපාදන අනුමත ක්‍රමවේද මත භාවිතා කිරීම.

iii. නිලධාරීන් අභිප්‍රේරණය නොකිරීම හේතුවෙන් මන්දෝත්සාහී වීම හා එමඟින් දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවයට සෘණාත්මක බලපෑමක් සිදු වීම.

නිලධාරීන් ඇගයීම් කිරීමට ක්‍රමවේද සකස් කිරීම. පුහුණු වීම් ලබා දීම.

iv. රක්ෂිත සීමා නිසිලෙස සළකුණු නොකිරීම නිසා රක්ෂිත සීමාවන්හි අනවසර ක්‍රියාකාරකම් බහුලව සිදුවීමත්, එමඟින් පරිසර හානිය වැඩිවීමත් සිදුවීම.

රක්ෂිත සීමා සලකුණු කිරීම සඳහා මායිම් කණු ඉදිකිරීමට ප්‍රතිපාදන වෙන් කිරීම.

v. ව්‍යාපෘති සැලසුම් කිරීම සඳහා වසර තුළම ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් කාලයක් නොලැබීම.

vi. වාරි පද්ධති ප්‍රතිසංස්කරණයෙන් අනතුරුව නඩත්තු කිරීමේ හා පසු විපරම් කිරීමේ ක්‍රමවේදයක් නොමැති වීම නිසා නිසි පරිදි නඩත්තු නොවීම. ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම. ප්‍රජා මූලික සංවිධාන සමඟ ගිවිසුම් ගත වීමේ / බැඳීමේ ක්‍රමවේදයක් නොමැති වීම.

vii. නිලධාරීන්ගේ භාෂා දැනුම අවම වීම නිසා අන්තර්ජාලය වැනි මාධ්‍ය භාවිතා කර නව දැනුම ලබාගැනීම දුෂ්කර වීම.

viii. ප්‍රතිලාභීන් සමඟ සෘජුව සම්බන්ධ නොවීම නිසා ව්‍යාපෘති සැලසුම් කිරීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී ගැටළු පැන නැඟීම.

ix. සුළු වාරි භූමි ප්‍රදේශවල යන්ත්‍ර සූත්‍ර භාවිතා කරන අවස්ථාවල දී ගොවි අවශ්‍යතා තේරුම්ගෙන කටයුතු නොකිරීම.

x. එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට වෙන් වන ප්‍රතිපාදන ප්‍රමාණය අවම වීම.

xi. වර්ෂය මුළ වෙන් කරනු ලබන ප්‍රතිපාදන පසුව වෙනස් වීම. (අඩු වීම)

xii. ප්‍රවාහන පහසුකම් අවම වීම.

xiii. අනෙක් ආයතන හා ප්‍රජාව වෙත සන්නිවේදනය වීමේ දුර්වලතා හේතුවෙන් නිසි කළමණාකරණයක් සිදු කිරීමට අපහසු වීම.

xiv. දෙපාර්තමේන්තුව අතර ආයතනවලත් දෙපාර්තමේන්තුව හා පරිබාහිර ආයතන අතරත් සම්බන්ධීකරණය අඩුවීම.

xv. ආයතන/ දෙපාර්තමේන්තුවල පවතින පොදු මතය හා කාර්යය පරාසය පිළිබඳ නිලධාරීන්ගේ දැනුම මඳ බව.

xvi. වාරි පද්ධති මිනුම් නොකිරීම.

xvii. භාණ්ඩ හා සේවා ලබා ගැනීමේ දී පවතින දීර්ඝ ක්‍රමවේදය.

xviii. නවීන තාක්ෂණික උපාංග අවම වීම.

xix. තාක්ෂණික මෙවලම් භාවිතය සඳහා ඇති පුහුණුව අවම වීම.

xx. ඇළ දොළ හා ගංගා අපවිත්‍ර වීම සම්බන්ධව අනෙකුත් ආයතන හා සම්බන්ධ නීති රාමුවක් නොමැති වීම

උදා: ඇළ ශුද්ධ කළ පසු ප්‍රාදේශීය සභාවලින් කුණු බැහැර කිරීම.

xxi. අවශ්‍යතාවය සැලකිල්ලට නොගෙන යෝජනා ඉදිරිපත් වීම.

xxii. ජල පෝෂක ප්‍රදේශ කළමණාකරණය සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තු දායකත්වය අඩු වීම.

xxiii. හදිසි ආපදා තත්වයක දී අවශ්‍ය සම්පත් අවම වීම.

xxiv. පුද්ගල අනන්‍යතාවය මත දෙපාර්තමේන්තු තීරණවලට එළඹීම. ක්‍රමවේද නොපැවතීම.

xxv. බාහිර පාර්ෂවයන්ට වාරිමාර්ග රක්ෂිත හඳුනාගැනීමේ ක්‍රමවේදයක් නොමැති වීම.

xxvi. ව්‍යාපෘතියක් සඳහා ඇස්තමේන්තු ලබා දීමේ දී ක්ෂේත්‍රයට ගැලපෙන පරිදි නිර්මිත ඉදි නොවීම නිසා ඉදිකිරීමේ දී හා පසුව ගැටළු මතු වීම.

xxvii. ඇළ මාර්ග සඳහා සිතියමක් නොමැති වීම.

## 6.4 අවස්ථා - Opportunities

i. වාරි කර්මාන්ත බහුලව පැවතීම නිසා පාර්ශවකරුවන්ට වැඩි ප්‍රතිලාභයක් ලබාදීම තුළින් ජාතික ආර්ථිකයට වැඩි දායකත්වයක් ලබාදීමට හැකි වීම.

ii. ප්‍රාදේශීය ලේකම් කාර්යාල, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා සංවර්ධන දෙපාර්තමේන්තුව, පළාත් පාලන ආයතන මඟින් ලැබෙන සහයෝගය.

iii. පුරන් කුඹුරු අස්වැද්දීම සඳහා හා වූ ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම නිසා වාරිකර්මාන්ත සිදුකිරීමේ පෙළඹවීම හා ඉල්ලුම ඉහළ යාම.

iv. තෙත් කලාපය සඳහා ඉහළ වර්ෂාපතනයක් ලැබීම නිසා අතිරික්ත ජලය වියළි කලාපයට හැරවීමේ වාරි ව්‍යාපෘති සිදුකිරීමට අවස්ථාව ලැබීම.

v. වාරිමාර්ග නොවන වෙනත් අවශ්‍යතා වෙනුවෙන් ජලය සඳහා ඉහළ ඉල්ලුමක් පැවතීම හේතුවෙන් වාරි ව්‍යාපෘති සිදු කිරීමේ අවස්ථාව ලැබීම. (උදා:- පානීය ජලය)

vi. ව්‍යාපෘති සඳහා වාර්ෂිකව ලැබෙන මූල්‍ය ප්‍රතිපාදන.

vii. ගොවිජන සේවා මධ්‍යස්ථාන මගින් ප්‍රාදේශීය ගොවි අවශ්‍යතා හඳුනාගැනීම මගින් වාරිමාර්ග වැඩ යෝජනා පෙන්වා දීම.

viii. අමාත්‍යාංශය, ප්‍රධාන ලේකම් කාර්යාලවල මෙහෙයවීමක් තිබීම.

ix. යන්ත්‍ර සූත්‍ර යම් ප්‍රමාණයක් හෝ සැපයුම්කරුවන්ගෙන් ලබා ගැනීමට ඇති හැකියාව.

x. කෘෂිකර්ම කමිටු මගින් ගොවීන්ගේ ඉටුකළ යුතු වාරි යෝජනා ඉදිරිපත් වීම.

xi. ගොවි සමිති සමග සෘජුව කටයුතු කිරීමට ඇති හැකියාව.

xii. නව තාක්ෂණ දැනුම සම්බන්ධව යාවත්කාලීනවීමේ අවස්ථාව ලබා ගැනීම.

xiii. යම් ව්‍යාපෘතියක් හෝ යෝජනාවක් ලබා ගැනීමේ දී එයට සම්බන්ධ ප්‍රතිලාබීන් හා ආයතනවලට සෘජුව මැදිහත්වීමට අවස්ථාව ලබා දී තිබීම.

xiv. දේශපාලන අධිකාරියෙන් ලැබෙන සහය.

xv. වී පර්යේෂණ ආයතනය, කෘෂිකර්ම පීඨය හා තාක්ෂණ පීඨය මගින් ලැබෙන සහයෝගය.

xvi. කාළගුණික විද්‍යා දෙපාර්තමේන්තුව හා කෘෂි පර්යේෂණ මධ්‍යස්ථාන සමග සම්බන්ධ වී කාළගුණ දේශගුණික තත්වයන් හඳුනා ගැනීම.

xvii. සුළු වාරිමාර්ග ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී එයට සෘජුවම මැදිහත් වන ගොවිජන සේවා කාර්යාලය හා ගොවි සංවිධාන සම්බන්ධ වී සිදු කිරීම.

xviii. බාහිර ආයතන මගින් ලැබෙන දත්ත හා තොරතුරු.

xix. වෙනත් ආයතන මගින් ලැබෙන ප්‍රතිපාදන.

xx. ගොවි සංවිධාන මගින් කාර්යයන් කර ගැනීමේ හැකියාව.

xxi. බාහිර ආයතන සමග ඒකාබද්ධ වී කටයුතු කිරීමට ඇති හැකියාව.

xxii. වන සංරක්ෂණ භූමි තුළ සිදු කරන වාරිමාර්ග කටයුතු, ප්‍රතිසංස්කරණ ආදියේ දී ඊට අවශ්‍ය සහයෝගය ලබා දීම.

## 6.5 තර්ජන - Threats

i. දේශපාලනික බලපෑම - වාරිමාර්ග සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී ප්‍රමුඛතාවය අනුව සැලසුම් සකස් කිරීමට බාධා කරමින් ඵලදායිතාවය අඩු ව්‍යාපෘති සැලසුම් සම්බන්ධයෙන් කටයුතු කිරීමට බල කිරීම, තම බල ප්‍රදේශයට වැඩි ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරන ලෙස බලපෑම් කිරීම හා තම හිතවතුන් විසින් සිදු කරන අනවසර ඉදිකිරීම්වලට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වන ලෙස බලපෑම් කිරීම.

ii. අනවසර ඉදිකිරීම් හා අල්ලා ගැනීම් - රක්ෂිත සීමා සලකුණු කිරීමට කටයුතු කිරීම තුළින් අවස්ථාවක් බවට පරිවර්ථනය කර ගැනීම. අනවසර ඉදිකිරීම් හා ගොඩ කිරීම්වලට අදාළ ක්‍රියා නැවැත්තුව ද ඒවා යථාතත්වයට පත් කිරීමට කටයුතු නොකිරීම.

iii. ජලාශයන්හි හා වාරි ඇල මාර්ග තුළ විවිධ ජලජ ශාක වර්ධනය වීම - ජලජ ශාඛ භාවිතා කරමින් කොම්පෝස්ට් පොහොර නිශ්පාදනයට යොමු වීම.

iv. විවිධ ආයතන මඟින් වාරිමාර්ග ඉදිකිරීම් හා අළුත්වැඩියාව - අප දෙපාර්තමේන්තුවේ නිර්ණායක වලට අනුකූලව ඉදිකිරීම් හා අළුත්වැඩියාවන් එකී ආයතන මඟින් ඉටුකිරීමට අවබෝධතා ගිවිසුමක් මඟින් කටයුතු කිරීම හා එම කර්මාන්ත අධීක්ෂණය පමණක් අප දෙපාර්තමේන්තුව මඟින් සිදු කර ඉතිරි වන ප්‍රතිපාදන වලින් ප්‍රමුඛතා ලැයිස්තුවේ වෙනත් ව්‍යාපෘති සිදු කිරීමට කටයුතු කිරීම.

v. පාරිසරික හා දේශගුණික බලපෑම - ගංවතුර ඇති වන ප්‍රදේශ හඳුනා ගැනීම හා බලපෑමට ලක්වන ප්‍රදේශ (පහත් බිම්) අනාරක්ෂිත ප්‍රදේශ ලෙස නම් කර ගැසට් කිරීම. එමඟින්, අනාරක්ෂිත ප්‍රදේශවලින් පදිංචිකරුවන් ඉවත් කිරීමට කටයුතු කළ හැකි වීම. (අනාරක්ෂිත ප්‍රදේශ ලෙස නම් කරන ප්‍රදේශ තුළ ජල හා විදුලි සැපයුම් වැනි මූලික අවශ්‍යතා ලබා ගැනීමට අවසර නොදීම, ගංවතුර සහනාධාර ලබා නොදීම මඟින් මෙසේ පදිංචිකරුවන් ඉවත් කිරීමට පහසුවේ)

vi. ප්‍රතිපාදන සීමා වීම.

vii. ඉහළ ජලධාර පෝෂක ප්‍රදේශ විනාශ වීම - පෝෂක ප්‍රදේශවල වන වගා සිදු කිරීම මඟින් හරිත කලාපයක් බිහිකිරීම.

viii. ව්‍යාපෘති සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නිසි පරිදි නොලැබීම.

ix. ජල මාර්ගවලට අපද්‍රව්‍ය දැමීම.

x. භූගොලීය පිහිටීම අනුව ජලය ලබා ගැනීමේ ගැටළුව.

xi. පාලනයකින් තොරව සතුන් ඇති කිරීම නිසා වන හානිය

xii. අනවසර වැලි කැපීම්.

xiii. වෙනස් වන රාජ්‍ය ප්‍රතිපත්ති.

xiv. ඉඩම් ගොඩකිරීමේ ප්‍රතිපත්ති පැහැදිලි නොවීම.

xv. ඇළ මාර්ගවලට කරදිය ගලා ඒම.

xvi. රසායනික පොහොර හා රසායනික ද්‍රව්‍ය නිසි ප්‍රමිතියෙන් භාවිතා නොවීම නිසා ජල ප්‍රභව දූෂණය වීම.

# පරිච්ඡේද අංක 07

# ක්‍රියාත්මක කිරීමේ විධිවිධාන



## 7. ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය

උපාය මාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන වැඩපිළිවෙල උපාය මාර්ගික සැලැස්ම මෙන්ම ඉතා වැදගත් වේ. මෙයට වැඩසටහන්, අරමුදල් හා ක්‍රමවේද සංවර්ධනය ඇතුළත් වන අතර එමගින් මානව සම්පත, ව්‍යුහ, ක්‍රියාවලි හා සම්පත් ඒකාබද්ධ කර ඉලක්ක කළ පරමාර්ථ, අරමුණු, උපායමාර්ග හා ප්‍රතිපත්ති ක්‍රියාවට නංවනු ලැබේ.

### 7.1 කාර්ය මණ්ඩල දැනුවත් කිරීම.

උපාය මාර්ගික සැලැස්ම සාර්ථකව ක්‍රියාවට නැංවීම සඳහා පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් පළාත් හා දිස්ත්‍රික් කාර්යාල වල කාර්ය මණ්ඩල සඳහා උපාය මාර්ගික සැලැස්ම පිළිබඳව පුළුල් දැනුමක් හා අවබෝධයක් ලබා දීම ඉතා වැදගත් වේ. මේ සඳහා පළාත් හා දිස්ත්‍රික් මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලැබේ. මේ සඳහා පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ විසින් උපාය මාර්ගික සැලසුම් දැනුවත් කිරීමේ කණ්ඩායමක් (Strategic Plan Awareness Team – SPAT) පත්කරනු ඇත. මෙය කණ්ඩායම් නායකයෙකුගෙන් හා සම්පත් දායකයෙකුගෙන් යුක්තය.

සියළුම කාර්යය මණ්ඩල සාමාජිකයින් උපාය මාර්ගික සැලැස්මේ දැක්ම, මෙහෙවර, පරමාර්ථ, අරමුණු, ප්‍රධාන කාර්ය සාධන දර්ශක හා සවිස්තරාත්මක ක්‍රියාත්මක සැලැස්ම පිළිබඳව දැනුවත් කරනු ඇත. මේ සඳහා උපාය මාර්ගික සැලැස්මේ මූලික කරුණු ඇතුළත් අත් පොතක් (guide lines) මුද්‍රණය කර එය සියළු කාර්යය මණ්ඩලයේ අත්පොත (Hand Book) බවට පත් කරනු ඇත. වාර්ෂික ඉලක්ක ඇතුළත් කර පෝස්ටර් නිර්මාණය කර දිස්ත්‍රික් කාර්යාලවල හා පළාත් කාර්යාලයේ දැන්වීම් පුවරු වල ප්‍රදර්ශනය කිරීම.

#### 7.1.1 ක්‍රියාත්මක සැලැස්ම

එක් එක් වසර සඳහා අවශ්‍ය ප්‍රතිපාදන, ආයතන හා ඒ ඒ අංශ භාර සියළුම අධීක්ෂණ මට්ටමේ නිලධාරීන්ගේ වගකීම් ඇතුළත් කොට ප්‍රධාන ක්‍රියාත්මක සැලැස්ම සකස් කෙරේ. (ඇමුණුම අංක 02) මේ සැලැස්ම පදනම් කර ගෙන ආයතන හා අංශ භාර අධීක්ෂණ නිලධාරීන්ද තම ආයතන හා අංශ සඳහා ඉලක්ක ගත අරමුණු, ක්‍රියාකාරකම් පදනම් කර ගනිමින් හා වාර්ෂික ප්‍රතිපාදන සැලකිල්ලට ගනිමින් තමා යටතේ වන සෙසු නිලධාරීන්ට වාර්ෂික ඉලක්ක ලබා දෙමින් හා වගකීම් පවරමින් වාර්ෂික ක්‍රියාත්මක සැලැසුම් සාදනු ලැබේ. එසේම පස් අවුරුදු සැලැස්ම ඉලක්ක ඇතුලත් කර ගනිමින් සියළුම නිලධාරීන්ට හා සේවයන්ට විධිමත් රැකියා විස්තර, රාජකාරී ලැයිස්තු හා කාර්ය සාධන ඇගයීම් වාර්තා ලබා දී ඇති බව තහවුරු කර ගනු ලැබේ.

වර්ෂය අවසානයේ පස් අවුරුදු සැලැස්මට අනුව එක් එක් නිලධාරියාට ලබා දුන් ඉලක්ක සපුරා ගෙන තිබේද යන්න පිළිබඳව කාර්යය සාධන ඇගයීම් වාර්තා මගින් නිරීක්ෂණය කරනු ලැබේ. ඒ අනුව එක් එක් නිලධාරියාට වැටුප් වර්ධක ලබා දීම, ප්‍රසංශා සහතික ලබා දීම සිදු කිරීමට අපේක්ෂා කරයි.

#### 7.1.2 දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාල

දිස්ත්‍රික් ඉංජිනේරු විසින්, තාක්ෂණික (සංවර්ධන) , ආයතනික හා ගිණුම් අංශ වෙත සංවර්ධන සැලැස්මට අනුව ඉලක්ක ගත ව්‍යාපෘති හා කාර්යයන් ඇතුළත් කොට ක්‍රියාත්මක සැලැස්ම

ක්‍රියාවට නංවනු ඇත. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් කාර්මික නිලධාරීන් විසින් ව්‍යාපෘති ක්‍රියාත්මක වීම අධීක්ෂණය කරනු ලැබේ.

පළාත් අධ්‍යක්ෂ කාර්යාලය විසින් ප්‍රගතිය සමාලෝචනය කිරීම මඟින් ව්‍යාපෘති වල ප්‍රගතිය අපේක්ෂිත මට්ටමේ පවත්වා ගැනීමට කටයුතු කරනු ලැබේ.

## 7.2 ධාරිතා සංවර්ධනය

සියළුම කාර්යය මණ්ඩල වලට ඔවුන්ගේ රාජකාරි ක්ෂේත්‍රවලට අදාලව දැනුම හා නිපුණතා ඉහළ නංවා ගැනීම සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කරනු ලැබේ. මෙහිදී තාක්ෂණික කළමනාකරණය හා පරිපාලන විෂය ක්ෂේත්‍රයන්ට අදාල පුහුණු සංවිධානය කෙරේ. මේ මඟින් ඔවුන්ගේ රාජකාරී තරඟකාරිත්වයකින් හා උසස් ගුණාත්වයකින් යුක්තව ඉටු කිරීමට අපේක්ෂා කෙරේ.

## 7.3 අභිප්‍රේරණය

සියළුම ආයතන ඒකක හා අංශවල කාර්යය මණ්ඩල සඳහා ආකල්ප සංවර්ධනය හා ධනාත්මක චින්තන වැඩසටහන් සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කොට පවත්වනු ලැබේ. මේ සඳහා දෙපාර්තමේන්තුවේ මෙන්ම බාහිර සම්පත් දායකයින් ද සුදුසු පරිදි යොදා ගනු ලැබේ.

බාහිර ගත පුහුණු වැඩසටහන් සංවිධානය කෙරෙනු ලැබේ. දැනටමත් ඇති සුභ සාධක සංගම්, ක්ෂේත්‍ර චාරිකා, සංගීතමය වැඩසටහන් වැනි විනෝදාත්මක වැඩසටහන් වලට උනන්දු කරනු ලැබේ.

## 7.4 ඵලදායිතා සංවර්ධනය

සියළුම ආයතන ඒකක හා අංශ සඳහා ඵලදායිතා සංකල්පය ක්‍රියාත්මක කෙරේ. තත්ත්ව පාලන කව, S5 වැනි ඵලදායිතා මූලධර්ම මෙහිදී යොදා ගනු ලැබේ . තොරතුරු තාක්ෂණය යොදා ගනිමින් කාර්යාලීය පරිපාලන ක්‍රම වැඩි දියුණු කරනු ලැබේ.

## 7.5 පසු විපරම් කළමනාකරණය

සෑම නිලධාරියෙක් සඳහාම ඉහත 7.1.1 සඳහන් කරන ලද පස් අවුරුදු සැලැස්ම, වාර්ෂික සැලැස්මේ හා කාර්ය සාධන ඇගයීම් වාර්තා වල ඇතුළත් ඉලක්ක හා වගකීම් සපුර තිබේද යන්න වාර්ෂිකව පසු විපරම් සිදු කරන අතර, ඒ අනුව අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගනු ඇත.

තවද, ආයතන ඒකක හා අංශ ප්‍රධානීන්ට තම කාර්යය මණ්ඩලයන්හි ගැටළු, අවශ්‍යතා, දුක්ගැනවිලි හා ඔවුන්ගේ යෝජනා ඉදිරිපත් කිරීමට කාලානුරූපීව පසුවිපරම් සාකච්ඡා සංවිධානය කිරීමට උපදෙස් දෙනු ලැබේ . මේ තුළින් රාජකාරී හා කාර්යාලයන්හි ඵලදායිතාව ඉහල නැංවීමට අපේක්ෂා කෙරේ.

## 7.6 ඇගයීම

පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්මමේදී නිලධාරීන් හා සේවකයන් විසින් ඉටු කරන ලද කාර්යයන් මෙන්ම කාර්යයන්හිදී අවසන් ප්‍රතිඵල හා බලපෑම පිළිබඳව ද ඇගයීමට ලක් කෙරේ.

## පරිච්ඡේද අංක 08

# ක්‍රමෝපායික සමාලෝචනය, ඇගයීම සහ පාලනය
















## 8.1 උපාය මාර්ගික සැලසුමේ පසුවිපරම් ක්‍රියාවලිය

➢ **ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.**

- සතියකට වරක් දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාල මට්ටමින් වැඩබිම් නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් යුතුව රැස්වීම් පවත්වා ප්‍රගතිය සමාලෝචනය කිරීම.
- දිස්ත්‍රික් ඉංජිනේරුවරුන්ගේ සහභාගීත්වයෙන් යුතුව පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයේ ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වා ප්‍රගතිය සමාලෝචනය කිරීම.
- දකුණු පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග ... අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් එම ලේකම් කාර්යාලය තුළ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ( පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ, ප්‍රධාන වාරිමාර්ග ඉංජිනේරු, වාරිමාර්ග ඉංජිනේරුවරුන්, ගණකාධිකාරී සහ දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගේ සහභාගීත්වය ඇතිව) මාස දෙකකට වරක් ප්‍රගතිය සමාලෝචනය කිරීම හා ගැටළු වලට විසඳුම් ලබා දීම.

➢ **ප්‍රගති වාර්ථා.**

- මසකට වරක් දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාල වලින් භෞතික හා මූල්‍ය ප්‍රගතිය ලබා ගෙන එමඟින් ප්‍රගතිය ප්‍රමාණවත් නොවන ව්‍යාපෘති පිළිබඳව නැවත සමාලෝචනයක් කර ප්‍රගතිය නියමිත ඉලක්ක වෙත ලඟා කර ගැනීමට දිස්ත්‍රික් ඉංජිනේරුවරුන්ට උපදෙස් ලබා දීම හා අවශ්‍ය මග පෙන්වීම ලබා දීම. පවතින ගැටළු විසඳීම.
- දිස්ත්‍රික් තුනෙහි ප්‍රගති වාර්තා සාරාංශගත කර කෘෂිකර්ම අමාත්‍යාංශය, සැලසුම් ලේකම් කාර්යාලය හා ප්‍රධාන ලේකම් කාර්යාලය යන අදාල ආයතනවලට යැවීම. එම ආයතන මඟින් ද අවශ්‍ය උපදෙස් ලබා දීම.

➢ **ක්ෂේත්‍ර පරීක්ෂණ.**

- දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාලයේ වැඩබිම් නිලධාරීන්ගේ නිරන්තර සෘජු අධීක්ෂණය සිදු කිරීම මඟින් ප්‍රමිතියෙන් උසස් ඉදිකිරීම් සිදුකිරීමට කටයුතු කිරීම.
- දිස්ත්‍රික් ඉංජිනේරුවරුන් සතියකට වරක් අධීක්ෂණය සිදු කරන අතර, ගැටළු ඇති ඕනෑම අවස්ථාවකදී ඒ සඳහා අවශ්‍ය කටයුතු කිරීම.
- පළාත් අධ්‍යක්ෂ කාර්යාලය මඟින් (පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂක, ප්‍රධාන වාරිමාර්ග ඉංජිනේරු, වාරිමාර්ග ඉංජිනේරුවරුන්) විසින් කාලීනව ක්ෂේත්‍ර පරීක්ෂා සිදු කර ප්‍රගතිය විමසීම හා ගැටළු වලට විසඳුම් ලබා දීම. එමඟින් ප්‍රගතිය නියමිත ඉලක්ක තුළ පවත්වා ගැනීම.
- කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් කාර්යාලය මඟින් අහඹු ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කර ප්‍රගතිය හා නිමාව පිළිබඳ අමාත්‍යාංශ ලේකම් කාර්යාලීය ප්‍රගති සමාලෝචන රැස්වීමේදී ඇගයීම් කිරීම.

➢ **ව්‍යාපෘති අධීක්ෂණය හා ඇගයීමේ ඒකකය.**

දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ව්‍යාපෘති වල ඇගයීම සිදු කිරීමේ අරමුණ ප්‍රධාන කරගත්, ව්‍යාපෘති අධීක්ෂණය හා ඇගයීමේ ඒකකය (PMEU) පිහිටවනු ලැබේ. ප්‍රධාන වාරිමාර්ග ඉංජිනේරුතුමාගේ ප්‍රධානත්වයෙන් හා ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් දෙදෙනෙකුගෙන් ද මෙම කමිටුව සමන්විත වන අතර, සෑම දිස්ත්‍රික්කයකම වසර තුල ක්‍රියාත්මක කල හා අවසන් කරන ලද ව්‍යාපෘති, අහඹු ලෙස තෝරා ගෙන එම

ව්‍යාපෘති වලට අදාල ක්ෂේත්‍ර පරීක්ෂා, ප්‍රගති වාර්තා, මූලික විමර්ෂණ වාර්තා ඇතුළු අනෙකුත් සියළු වාර්තා පරීක්ෂා කිරීමෙන් ව්‍යාපෘති පිළිබඳ ඇගයීමක් සිදු කරයි.

පළාත තුල දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන ලද මුළු ව්‍යාපෘති සංඛ්‍යාවෙන් 20% ක මෙලෙස ඇගයීමට ලක් කිරීමටත්, එම ඇගයීම් වාර්තා ඇතුලත් කර සාදනු ලබන ප්‍රධාන වාර්තාව සෑම වසරකම පළමු කාර්තුව තුළ පළාත් අධ්‍යක්ෂක වෙත යොමු කිරීමටත්, මෙම ඒකකය මඟින් කටයුතු කරනු ඇත.

- **අභ්‍යන්තර විගණන ඒකකය පිහිටු වීම.**

අභ්‍යන්තර විගණන ඒකකයක් දෙපාර්තමේන්තුවේ මව් කාර්යාලය මඟින් පිහිටු වීමට අපේක්ෂා කරයි. මෙය ප්‍රධාන වාරිමාර්ග ඉංජිනේරු, ගණකාධිකාරී හා පරිපාලන නිලධාරීගෙන් සමන්විත වේ. දෙපාර්තමේන්තුවේ මව් කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල තුනෙහි අභ්‍යන්තර විගණන කටයුතු සිදු කර අඩුපාඩු හඳුනාගෙන ඒවා නිවැරදි කිරීම හා ඉදිරියේදී එම අඩුපාඩු සිදු වීම වැළැක්වීම සඳහා කටයුතු කරයි.

මෙම ඒකකය මඟින් දෙපාර්තමේන්තුවේ සියළු කටයුතු වාර්ෂිකව විගණනය සිදු කරයි. එහිදී, පළාත් සභාවේ අභ්‍යන්තර විගණන ඒකකය හා ජාතික විගණන ඒකකය මඟින් පෙන්වා දෙන ලද ප්‍රශ්න ගත කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානයට යොමු කරයි.

- **ජනතා අදහස් ලබා ගැනීම.**

  - ජනතාවගේ පැමිණිලි වලට සවන් දීමෙන් ඉහල නිමාවකින් හා ප්‍රමිතියකින් යුතුව ඉදිකිරීම් පවත්වා ගැනීමට හැකි වීම.
  - දෙපාර්තමේන්තු වෙබ් අඩවිය හා මුහුණු පොත (Face book) ආශ්‍රයෙන් ජනතා අදහස් ලබා ගැනීම හා ජනතාව වෙත අවශ්‍ය තොරතුරු ලබා දීමට කටයුතු කිරීම.

# ඇමුණුම්

## 2.3.1 වාරිමාර්ග ඉදිකිරීම්, ඉඩම් හා ජල කළමනාකරණය

| කාර්ය සාධක දර්ශක | පාදක වර්ෂය2024 | 2025 ඉලක්ක | 2026 ඉලක්ක | 2027 ඉලක්ක | 2028 ඉලක්ක | 2029 ඉලක්ක |
|---|---|---|---|---|---|---|
| ප්‍රතිදානය 1.සංවර්ධිත ඇළ මාර්ග දිග(කි.මී) | 300 | 50 | 60 | 70 | 70 | 80 |
| | 255 | 50 | 60 | 70 | 70 | 80 |
| | 20 | 50 | 60 | 70 | 75 | 80 |
| 2. සංවර්ධිත වැව් සංඛ්‍යාව | 02 | 02 | 02 | 02 | 02 | 02 |
| | 23 | 05 | 05 | 05 | 05 | 05 |
| | 35 | 23 | 23 | 23 | 23 | 23 |
| 3.සිදු කරන ලද උත්සාන වාරි ව්‍යාපෘති සංඛ්‍යාව | 00 | 01 | 01 | 01 | 01 | 01 |
| 4. සංවර්ධිත එල්ලංගා පද්ධති සංඛ්‍යාව | 05 | 01 | 01 | 01 | 01 | 01 |
| ප්‍රතිඵලය 1.වාරි ජලය සපයන ලද ඉඩම් ප්‍රමාණය | 1500 | 1500 | 1650 | 1800 | 2000 | 2200 |
| | 1500 | 1500 | 1650 | 1800 | 2000 | 2200 |
| | 1500 | 1500 | 1650 | 1800 | 2000 | 2200 |
| ප්‍රතිදානය 1. රක්ෂිත හා ජල මූලාශ්‍ර වල අයිතිය තහවුරු කර ගැනීම සඳහා සිදු කරන ලද ව්‍යාපෘති ගණන | 4 | 2 | 2 | 2 | 2 | 2 |
| | 2 | 2 | 2 | 2 | 2 | 2 |
| | 1 | 2 | 2 | 2 | 2 | 2 |
| ප්‍රතිඵලය 1. පිහිටුවන ලද මායිම් ගල් ප්‍රමාණය | 717 | 200 | 200 | 200 | 200 | 200 |
| | 363 | 200 | 200 | 200 | 200 | 200 |
| | 520 | 200 | 200 | 200 | 200 | 200 |
| ප්‍රතිදානය 1.ගංවතුරෙන් ආරක්ෂාව සඳහා සිදු කරන ලද ව්‍යාපෘති ගණන | 15 | 20 | 20 | 20 | 20 | 20 |
| | 5 | 10 | 10 | 10 | 10 | 10 |
| 2.ඇළ මාර්ග ශුද්ධ කිරීම සඳහා මිළ දී ගත් යන්ත්‍ර සංඛ්‍යාව | 05 | 02 | 01 | 01 | 01 | 01 |
| 3.ගංවතුර තත්ව පුරෝකතනය සඳහා සිදු කරන ලද ව්‍යාපෘති ගණන | 00 | 01 | 00 | 01 | 00 | 01 |
| ප්‍රතිඵලය 1. ආරක්ෂිත ඉඩම් වපසරිය (හෙක්.) | 500 | 550 | 600 | 650 | 700 | 750 |
| | 1200 | 1250 | 1300 | 1350 | 1400 | 1450 |
| | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| ප්‍රතිදානය 1.කරිදිය ඇතුළු වීම වැලැක්වීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති ගණන | 6 | 8 | 8 | 8 | 8 | 8 |
| | 2 | 2 | 2 | 2 | 2 | 2 |
| | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| ප්‍රතිඵලය 1.කරිදිය ඇතුළු වීම වලක්වන ලද ඉඩම් අක්කර ප්‍රමාණය | 2500 | 3000 | 3000 | 3000 | 3000 | 3000 |
| | 500 | 500 | 500 | 500 | 500 | 500 |
| | 0 | 0 | 0 | 0 | 0 | 0 |

## 2.3.2 ජල මූලාශ සඳහා පරිසර කළමනාකරණය

| කාර්ය සාධක දර්ශක | පාදක වර්ෂය 2024 | 2025 ඉලක්ක | 2026 ඉලක්ක | 2027 ඉලක්ක | 2028 ඉලක්ක | 2029 ඉලක්ක |
|---|---|---|---|---|---|---|
| ප්‍රතිදානය<br>1.වාරි රක්ෂිත හා ජල පෝෂිත ප්‍ර දේශ සංරක්ෂණය හා ආරක්ෂණය කිරීම සම්බන්ධව මෙහෙයවන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් ගණන | 01 | 03 | 03 | 03 | 03 | 03 |
| 2.සිදු කරන ලද මායිම් ලකුණු කිරීමේ හා පුවරු සවි කිරීමේ ව්‍යාපෘති ගණන | 00 | 15 | 15 | 15 | 15 | 15 |
| 3. සංවර්ධනය කරන ලද ජල බුබුළු සංඛ්‍යාව | 12 | 03 | 03 | 03 | 03 | 03 |
| 4.සිදු කරන ලද වැව් සිසිලස ව්‍යාපෘති සංඛ්‍යාව | 00 | 01 | 00 | 01 | 00 | 01 |
| 5.ජල පෝෂිත ප්‍රෙද්ශ සංරක්ෂණය සඳහා සිදු කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව | 04 | 04 | 04 | 04 | 04 | 04 |
| ප්‍රතිඵලය<br>1.ආරක්ෂණය කරන ලද ජල පෝෂක ප්‍රදේශ (අක්කර) | 0 | 20 | 20 | 20 | 20 | 20 |
| | 0 | 20 | 20 | 20 | 20 | 20 |
| | 0 | 20 | 20 | 20 | 20 | 20 |
| ප්‍රතිදානය<br>1.ජලජ පැලෑටි යාන්ත්‍රිකව ඉවත් කිරීම සඳහා සිදුකරන ලද ව්‍යාපෘති ගණන | 35 | 05 | 05 | 05 | 05 | 05 |
| 2. ජලජ පැලෑටි ජෛව විද්‍යාත්මකව ඉවත් කිරීම සඳහා සිදුකරන ලද ව්‍යාපෘති ගණන | 01 | 05 | 05 | 05 | 05 | 05 |
| ප්‍රතිඵලය<br>1.ජලජ පැලෑටි වලින් බේරාගන්නා ලද වපසරිය(හෙක්.) | 200 | 20 | 20 | 20 | 20 | 20 |

## 2.3.3 ආයතන, ප්‍රතිපත්ති හා යහපාලනය

| කාර්ය සාධක දර්ශක | පාදක වර්ෂය2024 | 2025 ඉලක්ක | 2026 ඉලක්ක | 2027 ඉලක්ක | 2028 ඉලක්ක | 2029 ඉලක්ක |
|---|---|---|---|---|---|---|
| ප්‍රතිදානය<br>1.තත්ව පාලනය පිළිබඳව පවත්වන ලද පුහුණු වැඩමුළු සංඛ්‍යාව | 01 | 01 | 01 | 01 | 01 | 01 |
| ප්‍රතිඵලය<br>1.අපේක්ෂිත ශක්ති මට්ටම් ලඟා කර ගත් බව තහවුරු කරගන්නා ලද ව්‍යාපෘති සංඛ්‍යාවේ ප්‍රතිශතය (%) | 20% | 30% | 35% | 40% | 45% | 50% |
| ප්‍රතිදානය<br>1.ආයතන ධාරිතාව සංවර්ධනය කිරීම සඳහා මෙහෙයවන ලද පුහුණු වැඩමුළු සංඛ්‍යාව | 01 | 01 | 01 | 01 | 01 | 01 |
| 2.කාර්යාල සංවර්ධනය හා කළමණාකරණ තොරතුරු පද්ධති සංවර්ධනය සඳහා සිදු කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව | 01 | 02 | 02 | 02 | 02 | 02 |
| ප්‍රතිඵලය<br>1.දෙපාර්තමේන්තුවේ හා දිස්ත්‍රික් කාර්යාලවල ඵලදායිතා කුසලතා මට්ටම | විශේෂ කුසලතා | 03 | 03 | 02 | 02 | 01 |
| | 0 | විශේෂ කුසලතා | 03 | 02 | 02 | 01 |
| | විශේෂ කුසලතා | 03 | 03 | 02 | 02 | 01 |
| | විශේෂ කුසලතා | 03 | 03 | 02 | 02 | 01 |
| ප්‍රතිදානය<br>1.පාර්ශවකරුවන් හා ආයතන දුරස්ථභාවය අඩු කිරීම සඳහා පවත්වන ලද පුහුණු වැඩමුළු සංඛ්‍යාව | 01 | 01 | 01 | 01 | 01 | 01 |
| ප්‍රතිඵලය<br>1.අනෙකුත් ආයතන ප්‍රතිපාදන මත දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සඳහා ලැබී ඇති මුදල් ප්‍රමාණය (රු.මි) | 50 | 150 | 165 | 180 | 200 | 220 |
| | 50 | 150 | 165 | 180 | 200 | 220 |
| | 50 | 150 | 165 | 180 | 200 | 220 |
| ප්‍රතිදානය<br>1.විනිවිදභාවය වැඩි කිරීම සඳහා පවත්වන ලද පුහුණු වැඩමුළු සංඛ්‍යාව | 0 | 03 | 03 | 03 | 03 | 03 |
| ප්‍රතිඵලය<br>1.වාර්ෂිකව ඉදිරිපත් වූ ලංසුකරුවන් සංඛ්‍යාව | 20 | 30 | 35 | 40 | 45 | 50 |

### 2.3.4 නවීන තාක්ෂණය, නව සේවා හා තිරසර භාවය

| කාර්ය සාධක දර්ශක | පාදක වර්ෂය 2024 | 2025 ඉලක්ක | 2026 ඉලක්ක | 2027 ඉලක්ක | 2028 ඉලක්ක | 2029 ඉලක්ක |
|---|---|---|---|---|---|---|
| ප්‍රතිදානය<br>1.නව තාක්ෂණය භාවිතය හා පර්යේෂණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධව පුහුණු වැඩමුළු සංඛ්‍යාව | 01 | 01 | 01 | 01 | 01 | 01 |
| 2.සිදු කරන ලද පර්යේෂණ ව්‍යාපෘති සංඛ්‍යාව | 00 | 01 | 00 | 00 | 00 | 00 |
| ප්‍රතිඵලය<br>පුහුණු වැඩමුළු සඳහා තාක්ෂණ නිලධාරීන් සහභාගී වීමේ ප්‍රතිශතය | 60% | 65% | 70% | 75% | 80% | 85% |
| ප්‍රතිදානය<br>1.දෙපාර්තමේන්තු වෙබ් අඩවියට ඇතුළත් කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාවේ ප්‍රතිශතය (%) | 20% | 40% | 50% | 60% | 70% | 80% |
| ප්‍රතිඵලය<br>1.වෙබ් අඩවියට පිවිසෙන්නන්ගේ සංඛ්‍යාව | 8000 | 10000 | 12000 | 14000 | 16000 | 20000 |
| ප්‍රතිදානය<br>1. GIS හා GPS භාවිතය පිළිබඳව පවත්වන ලද පුහුණු වැඩමුළු සංඛ්‍යාව | 01 | 01 | 01 | 01 | 01 | 01 |
| 2.ජල මූලාශ්‍ර තොරතුරු සහිතව GIS තාක්ෂණය භාවිතයෙන් සිතියම් ගත කර යාවත්කාලීන කර අවසන් කරන ලද ග්‍රා.නි. වසම් ගණන | 2000 | 2050 | 2100 | 2150 | 2200 | 2200 |
| 3. සිතියම් ගත කරන ලද පෝෂක ප්‍රදේශ සංඛ්‍යාව (වැව් හා ජල මූලාශ්‍ර) | 0 | 05 | 05 | 05 | 05 | 05 |
| | 0 | 10 | 10 | 10 | 10 | 10 |
| | 0 | 35 | 35 | 35 | 35 | 35 |
| ප්‍රතිඵලය<br>1. දෙපාර්තමේන්තුවට අයත් බව, වෙන් කර හඳුනා ගන්නා ලද ජල මූලාශ්‍ර සංඛ්‍යාවේ ප්‍රතිශතය (%). | 50% | 55% | 60% | 65% | 70% | 75% |

